# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2010 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්

පිටුව


1. 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනත 1

2. 2010 අංක 18 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත 6

# 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]

**කාලය අනුව තීරණය කරනු ලබන ආකාරයකට ගෙවීම් පැහැර හැර ඇති බදු අයකර ගැනීම පිණිස ක්‍රමවත් සහ වඩා කඩිනම් ක්‍රියාවලියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; යම් අවස්ථාවන්හි දී පැහැර හැර ඇති බදු කපා හැරීම සඳහා ද ; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ඇතැම් නිශ්චිත නීති යටතේ පනවනු ලැබුවාවූ ද, දීර්ඝ කාලයක් මුළුල්ලේ ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තා වූ ද බදු, කඩිනමින් අයකර ගැනීම සඳහා යාන්ත්‍රණයක් සොයා ගැනීම අත්‍යවශ්‍යව ඇති හෙයින් ද:

එම ක්‍රියාවලියට පහසුකම් සැලසීම උදෙසා, පාලනය කළ හැකි සහ යුක්ති සහගත ආකාරයට එසේ පැහැර හරිනු ලැබ ඇති ඇතැම් බදු අයකර ගැනීම සඳහා සහ අනාගතයේ දී හිඟ බදු සාධාරණ සීමාවකට පවත්වාගෙන යෑම සහතික කර වීම සඳහා ද, එසේ ම මෙම කාර්යය භාරව සිටින නිලධරයන් මෙම බදු එකතු කිරීම සම්බන්ධයෙන් වඩාත් වගකිව යුතු තත්ත්වයකට පත්කිරීම සඳහා ද ක්‍රමයක් සකස් කිරීම අවශ්‍ය වී ඇති හෙයින් ද :

විනිවිද පෙනෙන සුලු සහ වගකීම් සහිත ක්‍රියාවලියක් අනුගමනය කරමින් ගෙවීම පැහැර හැර ඇති ඇතැම් බදු කපා හැරීම ද අවශ්‍යවී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින් මතු ''නියමිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මේ වගන්තිය හැර මෙම පනතේ සෙසු විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ප්‍රකාරව, කථානායකවරයාගේ සහතිකය, ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ විට, මේ වගන්තියේ විධිවිධාන බලාත්මක වන්නේ ය.

2. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ 2009 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර, පනවනු ලැබූ සහ නියම කරනු ලැබුවා වූ ද, අවුරුදු දෙකක් හෝ ඊට වැඩි කාලයක් මුළුල්ලේ හෝ අදාළ වන අවස්ථාවන්හි දී, යම් බද්දක් අයකර ගැනීම සඳහා එවැනි යම් නීතියක නිශ්චිතව සඳහන් සියලු අභියාචන පටිපාටි වැයකර අවසන් වීමෙන් පසු, එවැනි යම් නීතියක් යටතේ ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද (මේ පනතේ ''පැහැර හැර ඇති බද්ද'' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් බදු අයකර ගැනීම, නිදහස් කිරීම හෝ කපා හැරීම සඳහා මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය :

   එසේ වුව ද නියමිත දිනයට පෙරාතුව යම් පැහැර හැර ඇති බද්දක් අයකර ගැනීම සඳහා ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයක ප්‍රතිඵලයක් වශයෙන්, එකී බද්ද වාරික වශයෙන් හෝ අන්‍යාකාරයකට ගෙවීමෙන් එම බද්ද පියවීම සඳහා පැහැර හරිනු ලැබූ තැනැත්තා එකඟ වී ඇති හෝ එම කාර්යය සඳහා ඵලදායී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක සහ, ඉන් අනතුරුව පැහැර හරිනු ලැබූ තැනැත්තා එම එකඟත්වයට හෝ වැඩ පිළිවෙලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැර ඇති අවස්ථාවක, එම එකඟත්වය හෝ වැඩ පිළිවෙල සකස් කිරීම හෝ ඊට ඇතුළත්වීම අධිකරණයේ ආඥාවක් ප්‍රකාරව සිදු වූ අවස්ථාවල දී හැර, මේ පනතේ විධිවිධාන එකී එකඟත්වය හෝ වැඩ පිළිවෙල ප්‍රකාරව ගෙවා නොමැතිව ඇති ශේෂ මුදල අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ විය යුතු ය.

3. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වන (මෙහි මින් මතු ''කමිටුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) උපදේශක කමිටුවක් පත් කරනු ලැබිය යුතු අතර, එහි එක් සාමාජිකයකු අවස්ථාවෝචිත පරිදි, විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයකු විය යුතු අතර, ඔහු කමිටුවේ සභාපතිවරයා ද විය යුතු ය. අනෙක් සාමාජිකයන් හතර දෙනා බදු නීතිය, ගණකාධිකරණය සහ විගණනය, ව්‍යාපාර කළමනාකරණය හෝ මූල්‍ය යන ක්ෂේත්‍රවල දැනුම හා පළපුරුද්ද ඇත්තා වූ ද, ඒ ක්ෂේත්‍රයන් පිළිබඳව හැකියාවන් පෙන්නුම්කර ඇත්තා වූ ද, තැනැත්තන් අතුරින් තෝරාගත යුතු ය.

(2) කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු අතර, කමිටුවේ සියලු රැස්වීම්වල දී සභාපතිවරයා මුලසුන දැරිය යුතු ය. කමිටුවේ රැස්වීමකට සභාපතිවරයා නොපැමිණියහොත්, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් තැනැත්තකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(3) කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් ද, එම රැස්වීම්වල දී සිදුකරනු ලබන කටයුතු සම්බන්ධයෙන් ද වූ කාර්ය පටිපාටිය, කමිටුව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් හේතු දක්වා කමිටුවේ යම් සාමාජිකයකු වෙත යවනු ලබන ලිපියක් මගින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා වෙත අමතනු ලබන ලිපියක් මගින් කමිටුවේ යම් සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීමේ ලිපිය අමාත්‍යවරයා විසින් ලිඛිතව භාර ගැනීමෙන් පසු, එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(5) කමිටුවේ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකින් යුත් ප්‍රසාද දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

4. (1) කමිටුවේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) පැහැර හැර ඇති යම් බද්දක් කපා හැරීම සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලැබෙන දැනුම්දීම්වලට ප්‍රතිචාර දැක්වීම ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා හෝ අමාත්‍යවරයා විසින් උපදෙස් ලබාගැනීම සඳහා කමිටුව වෙත යොමු කරනු ලබන යම් කාරණාවක් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම.

(2) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී, කමිටුවේ තීරණය සඳහා කමිටුව ඉදිරියේ ඇති කාරණාවකට අදාළව යම් තොරතුරක් ලබාදීමට හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හැකි යයි කමිටුව සලකනු ලබන යම් තැනැත්තකු, කැඳවීමේ බලය, කමිටුව සතුව ඇත.

5. කොමසාරිස් ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමේ ඒකකය නම් වූ ඒකකයක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම ඒකකය භාරව සිටීමට නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

6. කමිටුව පත් කිරීමේ දින සිට මාස හයක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින්, මෙහි පහත දැක්වෙන ආයතනයන්හි පැහැර හරිනු ලැබූ බදු හඳුනාගනිමින් ඒ පිළිබඳ වාර්තාවක් පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීමේ ඒකකය මගින් පිළියෙල කර නිම කිරීමට කටයුතු සැලැස්විය යුතු ය :—

(අ) රාජ්‍ය සංස්ථා ;

(ආ) ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන ;

(ඇ) 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ සංස්ථා වශයෙන් පිහිටුවනු ලැබූ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන ;

(ඈ) ආණ්ඩුවේ අමාත්‍යාංශ ;

(ඉ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ; සහ

(ඊ) සමූපකාර ග්‍රාමීය බැංකු ඇතුළුව, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

7. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ 6 වන වගන්තිය යටතේ හඳුනාගත් ආයතනවල පැහැර හැර ඇති බදු සම්බන්ධයෙන් :—

(අ) පැහැර හැර ඇති බදු වශයෙන් වාර්තාගත වී ඇති මුදල් ප්‍රමාණයේ නිරවද්‍යතාවය පිළිබඳව අදාළ තැනැත්තන්ගෙන් විමසීමෙන් ; සහ

(ආ) එම හඳුනාගත් ආයතන ස්වකීය බදු වගකීම් සඳහා රජයේ අරමුදල් මත යැපෙන බවට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් කරනු ලබන තහවුරු කර ගැනීමක් ලබා ගැනීමෙන් අනතුරුව,

එම හඳුනාගත් ආයතනවල පැහැර හැර ඇති බදු කපා හැරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පැහැර හැර ඇති යම් බද්දක් කපා හැරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මාස තුනකට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම කරුණු පිළිබඳව කමිටුව වෙත දැනුම් දිය යුතු අතර, එම දැනුම් දීම ලැබීමෙන් මාස තුනක් ඇතුළත එම කරුණු පිළිබඳව යම් මත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කමිටුවට හිමිකම් ඇත්තේ ය. එසේ මත ප්‍රකාශයක් කරනු ලැබූ විටක දී, එම මත ප්‍රකාශ කිරීම පිළිබඳව වහා ම ප්‍රතිචාර දැක්වීම කොමසාරිස් ජනරාල්වරයාගේ වගකීම වන්නේ ය.

8. මේ පනතේ 7 වන වගන්තිය යටතේ පැහැර හැර ඇති බද්දක් කපා හරිනු ලබන අවස්ථාවක :—

(අ) පැහැර හැර ඇති බද්ද පනවා ඇත්තේ සහ අයකර ගනු ලබන්නේ යම් නීතියක් යටතේ ද, එම නීතියේ අන්තර්ගත රහස්‍ය භාවයට අදාළ යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් එසේ බදු කපා හැරීමේ දින සිට දින තිහක් ඇතුළත එම තොරතුරු ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය ; සහ

(ආ) කපා හැර ඇති පැහැර හරින ලද බද්ද, එකී බද්ද අයකර ගනු ලබන සහ පනවා ඇති අදාළ නීතියේ විධිවිධාන යටතේ පසුව අයකර ගනු ලබන අවස්ථාවක, එසේ අයකර ගනු ලබන මුදල් ප්‍රමාණය, පැහැර හරිනු ලැබූ තැනැත්තාට ආපසු නොගෙවිය යුතු ය.

9. (1) 7 වන වගන්තිය යටතේ පැහැර හැර ඇති යම් බද්දක් කපා හරිනු නොලැබූ අවස්ථාවක දී :—

(අ) ගෙවීම පැහැර හැර ඇති බද්ද වාරික වශයෙන් ගෙවීම සඳහා පැහැර හරිනු ලැබූ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා සමග එළඹී ඇති යම් ගිවිසුමක් ; හෝ

(ආ) යම් නීති කෘත්‍යයක් අධිකරණයක ගොනුකර ඇති අවස්ථාවක දී හැර, එම බද්ද පනවා ඇත්තේ සහ අයකර ගනු ලබන්නේ යම් නීතියක් යටතේ ද, එම නීතිය යටතේ ඒ බද්ද අයකර ගැනීම සඳහා කටයුතු අරඹා ඇති අවස්ථාවක්,

නොතකා, පැහැර හැර ඇති බද්ද වශයෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර දක්වමින් සහ එම මුදල එකී දැන්වීම ලැබීමේ දින සිට දින හැටක් ඇතුළත ගෙවන ලෙස ඉල්ලා සිටිමින්, පැහැර හරිනු ලැබූ තැනැත්තා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබූ පැහැර හරිනු ලැබූ තැනැත්තකු හට, එහි සඳහන් දින හැටක කාල සීමාව ඉකුත් වීමට පෙර :—

(අ) කොමසාරිස් ජනරාල්වරයා එකඟවන පරිදි, පැහැර හැර ඇති බද්ද වාරිකවලින් ගෙවා බේරුම් කිරීමට එම තැනැත්තාට අවසර දෙන ලෙස ඉල්ලා සිටිමින් ; හෝ

(ආ) දැන්වීමේ සඳහන් පැහැර හැර ඇති බද්ද ගෙවීම සම්බන්ධයෙන් යම් විරෝධතා මතු කරමින්,

කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය හැකි ය.

(3) පැහැර හැර ඇති බද්ද වාරිකවලින් ගෙවා බේරුම් කිරීම සඳහා පැහැර හරිනු ලැබූ තැනැත්තා ඉල්ලා සිටින අවස්ථාවක දී, එකඟත්වයට එළඹෙන දිනයේ සිට අවුරුදු තුනකට නොවැඩි කාලයක් ඇතුළත එකී මුදල සම්පූර්ණයෙන් ගෙවන බවට වූ කොන්දේසියට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා හට එසේ ගෙවීම සම්බන්ධයෙන් එකඟ විය හැකි ය. පැහැර හරිනු ලැබූ තැනැත්තා සමග එළඹුන එකඟත්වය පිළිබඳ විස්තර, කොමසාරිස් ජනරාල්වරයා විසින් කමිටුව වෙත දැනුම් දිය යුතු ය.

(4) එවා ඇති දැන්වීමේ සඳහන් පැහැර හැර ඇති බද්ද ගෙවීම සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ තැනැත්තා යම් විරෝධතාවක් මතු කරන අවස්ථාවක, එකී විරෝධතාව ලැබී දින හැටක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සම්බන්ධයෙන් තම තීරණය ගත යුතු අතර, එම විරෝධතාව අයවිය යුතු බදු මුදල නැවත නිශ්චය කිරීමකට තුඩු දෙන අවස්ථාවක දී, එසේ නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයට වඩා පැහැර හැර ඇති බදු මුදල වැඩි වේ නම්, එම අතිරික්ත මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් අත් හැරිය යුතු ය.

10. 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් යවන ලද්දේ යම් පැහැර හරිනු ලැබූ තැනැත්තකු වෙත ද, එම තැනැත්තා විසින් :—

(අ) එම උපවගන්තියේ සඳහන් කාලය ඇතුළත දැන්වීමට ප්‍රතිචාර දැක්වීම පැහැර හරින අවස්ථාවක දී ; හෝ

(ආ) පැහැර හැර ඇති බද්ද වාරිකවලින් ගෙවන බවට කොමසාරිස් ජනරාල්වරයා සමග ගිවිසුමකට ඇතුළත් වීමෙන් අනතුරුව, දින තිහකට වැඩි කාලයක් එම වාරික ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී,

කොමසාරිස් ජනරාල්වරයා විසින් එම පැහැර හරිනු ලැබූ තැනැත්තා වෙත ගෙවීම පැහැර හැරීම පිළිබඳ දැන්වීමක් නිකුත් කළ යුතු අතර, පැහැර හැර ඇති බද්ද වශයෙන් අයවිය යුතු මුදල, පළාතක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද්දා වූ සහ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් සිවිල් අධිකරණ බලය පවරා ඇත්තා වූ ද, මහාධිකරණයක තත්කාර්ය සඳහා පවරන ලද නඩුවක් මගින් අයකර ගනු ලැබිය යුතු ය.

11. මේ පනත යටතේ පැහැර හැර ඇති බදු අයකර ගැනීමේ කාර්යය සඳහා, කොමසාරිස් ජනරාල්වරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්, දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි අතර, එම නිශ්චිත කාලය ඇතුළත ඉල්ලා ඇති තොරතුරු සැපයීම එම තැනැත්තාගේ කාර්යය වන්නේ ය. ඉල්ලා ඇති තොරතුරු කවර හෝ හේතුවක් නිසා ඉදිරිපත් කිරීමට එම තැනැත්තාට නොහැකි වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා වෙත එම හේතු වහා ම දන්වා සිටීම, එම තැනැත්තාගේ කාර්යය වන්නේ ය.

12. 2010 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලිත් වර්ෂයක අවසානය වන විට, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ දණ්ඩන මුදලක් හෝ අත්හිට වූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටසක් හෝ හැර, බදුවල මුළු එකතුව ඊට පෙරාතුව ම වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩිවන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුව ම වූ වර්ෂයේ එම නීති යටතේ පනවනු ලැබූ සහ නියමකරනු ලැබූ බදුවලින් ලබන ලද මුළු බදු ප්‍රමාණයෙන් සියයට තුනක් නොඉක්මවන බවට වගබලා ගැනීම, කොමසාරිස් ජනරාල්වරයාගේ කර්යය වන්නේ ය.

13. (1) 2010 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලිත් වර්ෂයක් අවසාන වන විට මේ පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියක් යටතේ පැහැර හැර ඇති, එහෙත් ඊට උපචිත වූ දණ්ඩන මුදලක් හෝ අත්හිටවූ හෝ විලම්භනය කරන ලද යම් බදු මුදලක කොටසක් හෝ හැර, බදුවල මුළු එකතුව, ඊට පෙරාතුව ම වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වඩා වැඩි වන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය, එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීති යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදුවලින් ලබාගන්නා ලද මුළු බදු ප්‍රමාණයෙන් සියයට තුනක් ඉක්මවන අවස්ථාවක දී, එම අතිරික්තය සඳහා හේතු දක්වමින් සහ එම අතිරික්තය නැතිකිරීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිකර්මික ක්‍රියා සම්බන්ධයෙන් නිර්දේශ කරමින්, එකී වර්ෂය අවසානයේ සිට මාස හතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද තම වාර්තාවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කර ඇති හේතු අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන අවස්ථාවක දී, එම වාර්තාවේ සඳහන් නිර්දේශ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු පියවර ගන්නා ලෙස, අමාත්‍යවරයා විසින් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද තම වාර්තාවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙන ලද හේතු, එම අතිරික්තය සඳහා ප්‍රමාණවත් බවට අමාත්‍යවරයා විසින් පිළිගනු නොලබන අවස්ථාවක දී, තම ලිපිය ලැබී මාස හයක් ඇතුළත එම උපවගන්තිය මගින් පනවා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා කරන ලෙස, අමාත්‍යවරයා විසින් කොමසාරිස් ජනරාල්වරයාට ලිඛිතව නියම කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නියමිත කාලය ඇතුළත එම උපවගන්තිය යටතේ කරන ලද නියමයට අනුකූලව ක්‍රියා කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් පැහැර හරින අවස්ථාවක දී, අමාත්‍ය මණ්ඩලය විසින් අවස්ථාවට උචිත යයි සලකනු ලබන යම් ක්‍රියා මාර්ගයක් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව ගත යුතු ය.

14. කමිටුවේ සෑම සාමාජිකයකු ම, තමා සාමාජිකයකු වශයෙන් රාජකාරි කටයුතුවලට ඇතුළත් වීමට පෙරාතුව, මේ පනතේ 4 වන වගන්තිය යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේ දී තමාගේ දැන ගැනීමට පාත්‍ර වූ සියළු කාරණා සම්බන්ධයෙන් දැඩි රහස්‍යභාවය ආරක්ෂා කරන බවට පොරොන්දු වෙමින් ප්‍රකාශ පත්‍රයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, එකී ප්‍රකාශ පත්‍රය මගින් පහත දැක්වෙන අවස්ථාවල දී හැර, එවැනි කිසිම කරුණක් හෙළිදරව් නොකරන බවට ද පොරොන්දු විය යුතු ය :—

(අ) එසේ කාරණා හෙළි කිරීම සඳහා යම් අධිකරණයක් විසින් නියම කරනු ලැබීමේ දී හෝ කැඳවනු ලැබූ අවස්ථාවක දී; හෝ

(ආ) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා.

15. මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කර්තව්‍ය හෝ බලතලවලින් යම් කර්තව්‍ය හෝ බලතල, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත්කරන ලදැයි සලකනු ලබන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයා යම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයකු, කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ තක්සේරුකරුවකු වෙත, පවරනු ලැබිය හැකි ය.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

"කොමසාරිස් ජනරාල්වරයා", "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයා", "නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයා", "ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයා", "කොමසාරිස්වරයා", "නියෝජ්‍ය කොමසාරිස්වරයා". සහ "තක්සේරුකරු" යන්නට, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ එම යෙදුම් සඳහා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"පැහැර හැර ඇති තැනැත්තා" යන්නෙන්, මෙම පනතේ 2 වන වගන්තියේ විධිවිධානවලට අනුව බදු පැහැර හැර ඇත්තා වූ තැනැත්තකු අදහස් වේ ;

"ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතනය" යන්නෙන්, 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්පත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්පත් කර ගත් හෝ ආණ්ඩුවට සතුකර ඇති ව්‍යාපාර ආයතනයක් අදහස් වේ; සහ

18. 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනයේ (3) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්, එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

"(4) 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනතේ 10 වන වගන්තිය යටතේ පවරන ලද නඩු."

### උපලේඛනය [2 වන වගන්තිය]

1. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත
2. 1971 අංක 51 දරන ප්‍රාග්ධන බදු පනත
3. 2002 අංක 16 දරන හර බදු පනත
4. 2006 අංක 13 දරන ආර්ථිකසේවා ගාස්තු පනත
5. 1980 අංක 13 දරන බූදල් බදු පනත
6. 1963 අංක 11 දරන මුදල් පනත
7. 2004 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත
8. 2004 අංක 11 දරන මුදල් පනත - 1 වන කොටස
9. 2005 අංක 5 දරන මුදල් පනත - 1 වන කොටස
10. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත
11. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත
12. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත
13. 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත
14. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
15. 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත
16. 1964 අංක 36 දරන ලාභ බදු (විශේෂ විධිවිධාන) පනත
17. 1967 අංක 13 දරන සහල් සහනාධාර බදු පනත
18. 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත

19. 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත
20. 1982 අංක 25 දරන ධනබදු අධිභාර පනත
21. 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත
22. 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත
23. 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත
24. 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත
25. 1991 අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත
26. 1992 අංක 32 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත
27. 1993 අංක 28 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත
28. 1994 අංක 23 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත
29. 1995 අංක 13 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත
30. 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත
31. 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත
32. 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත

## 2010 අංක 18 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]

**1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහා ද, 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීමට ආනුෂංගිකව විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2010 අංක 18 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට ඉවත් කරනු ලැබේ.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීමේ දී —

(අ) ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියළු නිලධරයන් සහ සේවකයන්ගෙන් යම් නිලධරයකු හෝ සේවකයකුගේ සේවය රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බැව් භාණ්ඩාගාරයේ ලේකම් විසින් සලකනු ලබන්නේ නම් ඔවුන් ඉවත් කිරීමේ දිනයේ සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නිලධරයන් හෝ සේවකයන් ලෙස බඳවා ගනු ලැබිය යුතු අතර, ඉවත් කිරීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි එම නිලධරයන් සහ සේවකයන් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ භුක්තිවිඳින ලද නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන කොන්දේසි මත ධුර දැරිය යුතු ය:

එසේ වුව ද, එකඟ වූ නියම සහ කොන්දේසි එම නිලධරයන්ට සහ සේවා නියුක්තිකයන්ට පෞද්ගලික විය යුතු ය;

(ආ) ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ හෝ බලාත්මක වූ ද කොමිෂන් සභාව පාර්ශ්වකරුවකු වූ ද කොමිෂන් සභාවේ වාසියට ඇත්තා වූ ද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියළු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇප සහතික, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජනය පිළිබඳ ප්‍රදාන සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍ර, ඉවත් කිරීමේ දිනයේ සිට අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා රජය විසින් ඇතුළත් වූ හෝ තම වාසියට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇප සහතික, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජනය පිළිබඳ ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබ ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සියලු නඩු සහ නීති කෘත්‍ය ඉවත් කිරීමේ දිනයේ සිට ශ්‍රී ලංකා රජය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු සහ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා දිගට ම පවත්වාගෙන යා යුතු ය;

(ඈ) යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී යම් අධිකරණයක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාසියට හෝ ඊට එරෙහිව වාර්තාගත කරන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, ඉවත් කිරීමේ දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රජයේ වාසියට හෝ ඊට එරෙහිව වාර්තාගත කරන ලද නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ වෙනත් ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

4. මේ පනත ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලු වත්කම් සහ බැරකම් මේ පනත ඉවත් කිරීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රජය වෙත සතු විය යුතු ය.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ —

''ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව'' යන්නෙන් 1996 අංක 1 දරන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ.